F13

# මහවැලි ජනාවාස හා කෘෂිකර්මික කටයුතු අතර සම්බන්ධතාව

සෙනරත් ගමගේ,
භූගෝල විද්‍යා අධ්‍යයනාංශය,
රුහුණ විශ්ව විද්‍යාලය,
මාතර.

මහවැලි සංවර්ධන ව්‍යාපාරය දැනට ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන මහා පරිමාණ කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාරය වේ. එහි සැලසුම් ශ්‍රී ලංකාවේ ක්‍රියාත්මක වන අනෙකුත් කෘෂිකාර්මික සංවර්ධන ව්‍යාපාරවලට වඩා වෙනස් වේ. මහවැලි සංවර්ධන සැලසුම්වල දී ජනාවාස හා කෘෂිකාර්මික කටයුතු අතර සම්බන්ධතාව ආරක්ෂා කිරීමට උත්සාහ ගෙන ඇත. ඒ සඳහා සියළුම ජනාවාස වල සිට අවම භෞතික දුරකින් කුඹුරු ඉඩම් ගොවීන්ට ලබා දීමට කටයුතු යොදා ඇත.

මහවැලි සංවර්ධන සැලසුම යටතේ මෙවැනි සම්බන්ධතාවක් අපේක්ෂා කල ද කුඹුරු ඉඩම් වලින් ලැබූ ප්‍රතිලාභ පසු ගිය අවුරුදු 5 තුළ දැඩි උච්චාවචනවලට ලක්ව ඇත. එම උච්චාවචන කාලික වශයෙන් මෙන්ම ක්ෂේත්‍රීය වශයෙන් ද හඳුනාගත හැකිය. එවැනි අස්වැන්න විෂමතා සඳහා බලපෑ හැකි වැදගත් විචල්‍යයක් වශයෙන් ජනාවාස හා කෘෂිකාර්මික ඉඩම් අතර දුර (භෞතික දුර) පෙන්වා දිය හැකිය.

මහවැලි සංවර්ධන ව්‍යාපාරයේ ආරම්භක සංවර්ධන කලාපය මහවැලි 'එච්' ප්‍රදේශයයි. එහි කලංකුට්ටිය කොට්ඨාශයේ 307 බෙදුම් ඒකකය ඇසුරෙන් කළ පර්යේෂණයකට අනුව මෙම සම්බන්ධතාව විමසා බලන ලදී.

එම් ප්‍රදේශයේ කෘෂිකාර්මික ඉඩම්වල අස්වැන්න කෙරෙහි බලපාන දුර සාධක තුනක් මෙහිදි අධ්‍යයනය කළ හැකි විය. එනම්, (1) ජනාවාසවල සිට කුඹුරු ඉඩම් වලට ඇති භෞතික දුර, (2) ප්‍රධාන ඇල කෙළවර සිට කුඹුරු ඉඩම්වලට ඇති දුර සහ, (3) අවභැරවුම සිට කුඹුරු ඉඩම් වලට ඇති දුර වේ.

මීත් ඇල මාර්ග හා සම්බන්ධිත දුර විචල්‍ය දෙකම ප්‍රදේශයේ ජල සම්පාදනය හා සම්බන්ධයෙන් වැදගත් වේ.

මෙම අධ්‍යයනයෙන් හෙළි වූ නිගමන කිහිපයක් පහත දැක් වේ. එනම්,

ප්‍රදේශයේ වැඩි අස්වනු ලබන ගොවීන්ට කෘෂි දුර බලපෑමක් නැත. (2) අඩු අස්වැන්න ලබන ගොවීන්ට කෘෂි දුර තරමක බලපෑමකින් යුක්තය. (3) කුඹුරු ඉඩම්වල අස්වැන්න විෂමතාවලට බලපාන ප්‍රධාන දුර විචල්‍ය වනුයේ ජල දුරයි. (4) ඇල කෙළවර පිහිටි කුඹුරු ඉඩම්වල අස්වැන්න අඩුවීමේ නැඹුරුවක් පවතී. (5) ගොවිපල කළමනාකාරණය ආශ්‍රිත ගැටළු (වාරිමාර්ග ඉදිකිරීම්, ඉඩම් භුක්ති ක්‍රමය අස්වැන්න අඩුවීමට බල පා ඇත.

එම නිසා ජනාවාස හා කෘෂිකාර්මික ඉඩම්වල සම්බන්ධතාව සැලකීමේ දී ගොවිපළ කළමනා- කරණය ගැන විශේෂ උනන්දුවක් දැක්වීම අවශ්‍ය බව අනාවරණය වේ.